**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2019**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම

--------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 හි ක්‍රම ක්ෂය අගයට ගන්නා මූල්‍ය වත්කම් (Financial Assets at Amortized Cost) යටතේ දක්වා ඇති එකතුව රු.3,601,600,000 ක් වූ ණයකර හා ස්ථාවර තැන්පතු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 (SLFRS 09) ට අනුව ක්‍රම ක්ෂය අගයට (Amortized cost) දක්වා නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ක්‍රම ක්ෂය ක්‍රමයට පෙන්වීම අනිවාර්ය නොවේ. | භාර අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සඳහන් පරිදි අරමුදලේ ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පිළියෙල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි පරිච්ඡේද 49 ට අනුව මූල්‍ය ප්‍රකාශ | ඉදිරියේදී පෙර වර්ෂයේ කරන ලද ගැලපීම් | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව |

| | | |
|---|---|---|
| පිළියෙල කිරීමේදී ගැලපුම් සිදුකරන පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළයුතු වුවත්, භාර අරමුදල විසින් ගලපන ලද එකතුව රු.42,955,902 ක්වූ පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි. | සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පෙර කාලඡේදවලට අදාළ ගැළපීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදුකරන ලද ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වුවත් භාර අරමුදල විසින් සම්බන්ධිත පාර්ශවයන් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු හෙළිදරව් කර නොතිබුණි. | භාර අරමුදලට සම්බන්ධිත පාර්ශව වශයෙන් හඳුනාගෙන ඇති සියලු ආයතන මහපොළ භාර අරමුදලේ උප සමාගම් හා පාලිත සමාගම් වේ. එම ගණුදෙනු සම්බන්ධිත පාර්ශව අතර සිදු වූ ගණුදෙනු වශයෙන් වර්ගීකරණය කළ නොහැක. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2005 වර්ෂයේදී රු.12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි. | රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලැබුණු පසු වර්තමාන අගය පොත්වලට ගනු ලැබේ. | වත්කම්වල සත්‍ය අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ)මහපොළ භාර අරමුදල විසින් මාලඹේ පිහිටි SLIIT ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමට හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු.408,500,000 ක් වැයකර තිබුණි. SLIIT ආයතනය විසින් එම මුදල නැවත මහපොළ භාර අරමුදල වෙත 2015 වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි. එසේ වුවද ගොඩනැගිලිවල අයිතිය තහවුරුකර ගැනීමකින් හා වර්තමාන අගය පිළිබඳ නිවැරදි තක්සේරුවකින් තොරව භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු.1,064,520,695 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව ලැබුණු පසු ගොඩනැගිලිවල වර්තමාන වටිනාකම ගිණුම්වලට ගනු ලැබේ. | ගොඩනැගිලිවල අයිතිය නිරවුල් කරගෙන සහ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් පසු නිවැරදි අගයන් පොත්වලට ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.2,381,392 ක් වුවද එදිනට බැංකු ශේෂ සනාථකිරීම් අනුව රු.2,407,963 ක් විය. | බැංකුව 2019 දෙසැම්බර් 28 දිනට ශේෂය දක්වා ඇත. | වෙනසට හේතු සොයා අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |
| (ඈ) 2020 ජුනි මස 01 දිනැති ජනාධිපති අරමුදලේ PS/PF/5/36/Vol-ix/2020 ලිපිය පරිදි 2019 වර්ෂය සඳහා වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාළ ලාභ කොටස රු. 1,160,977,603 ක් වුවද භාර අරමුදල විසින් අදායම් ප්‍රකාශයේ වර්ෂයට අදාළ ආදායම රු.997,346,600 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාළ ආදායම ආදායම් ප්‍රකාශයේ රු.163,631,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාළ ලාභ කොටස ජනාධිපති අරමුදල විසින් 2020.02.28 දින වන විටත් තහවුරු කර නොමැති බැවින් අදායම නිවරැදිව ගිණුම්ගත කිරීමට නොහැකි විය. | මහපොළ භාර අරමුදලට හිමි ලාභ කොටස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර තහවුරු කර ගැනීමට සහ ගණනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභ කොටස ජනාධිපති අරමුදලින් දන්වා තිබූ පරිදි රු.185,289,003 ක් වුවද මූල්‍ය තත්ත්ව විස්තරයේ එය රු.75,000,000 ලෙස දැක්වීමෙන් ලැබිය යුතු ලාභය රු.110,289,003 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් 2019.12.31 දිනට භාර අරමුදලට ලැබිය යුතු ලාභ කොටස ජනාධිපති අරමුදල විසින් 2020.02.28 දින වන විටත් තහවුරු කර නොමැති බැවින් ලැබිය යුතු ශේෂය නිවරැදිව ගිණුම්ගත කිරීමට නොහැකි විය. | මහපොළ භාර අරමුදලට ජනාධිපති අරමුදලින් එවා නොමැති ලාභ කොටස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර ගණනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති වර්ෂය තුළ දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් වටිනාකම රු.16,426,582 ක් වුවද එහි සත්‍ය වටිනාකම රු.16,248,500 ක් විය. | මෙය පෙර වර්ෂ ගැළපීම්වලදී සිදුවූ ගිණුම්කරණ දෝෂයක් බවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුළ ගැළපීම්වලින් ඉවත් විය යුතුය. ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ දෝෂ හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඊට ඇතුළත් කළ යුතුය. |

### 1.5.4 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු වුවත් එසේ පිලියෙළ කර නොතිබුණි. | 2019 ජූලි 12 දින පැවති COPE කමිටුවේදී 2019 වර්ෂයේ සිට ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට ලද අනුමැතිය අනුව ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සඳහා භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ විගණන සමාගමක් වෙත භාර දී ඇත. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට කඩිනමින් ඉදිරිපත් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමූපකාර හා තොග වෙළඳ සංස්ථා ගොඩනැගිල්ල කුළී පදනම මත ලබා ගැනීම සඳහා තැබූ රු. 348,810ක කුළී තැන්පතු මුදල එම ගොඩනැගිල්ලෙන් ඉවත් වී දැනට වර්ෂ 3ක් ගතවුවද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017.11.29 දින හා 2018.04.04 දින ස.තො.ස ආයතනය වෙත ලිඛිත ඉල්ලීම් කර ඇතත් එම ආයතනය විසින් කුළී තැන්පතුව ආපසු ගෙවා නොමැත. | තැන්පතු මුදල කඩිනමින් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඉල්ලීම් කිරීමක් නොමැති බැවින් භාණ්ඩාගාර අනුමැතිය යටතේ ගිණුම්වලින් කපා හැරීමට කටයුතුකර නොතිබුණි. | ස.තො.ස ආයතනය යටතේ පිහිටුවා තිබූ සී.ඩබ්.ඊ. කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉංජිනියරිං (පුද්ගලික) සමාගම වසා දමා ඇති බැවින් හා භාර අරමුදල හා මෙම සමාගම අතර කොන්ත්‍රාත් ගිවිසුමක් නොමැති බැවින් එම ආයතනය සඳහා ගෙවීම් භාර අරමුදල මඟින් සිදුකළ නොහැක. ඒ අනුව භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ මෙම ගෙවිය යුතු ශේෂය ඉදිරියේදී ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරනු ඇත. | අදාල අනුමැතීන් ලබාගෙන කඩිනමින් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103(1)(අ) හා 104 (3), (4) | අරමුදලට අයත් මෝටර් රථයක් 2019.05.20 දින හදිසි අනතුරකට ලක්වූවත් ඒ සම්බන්ධයෙන් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුර සම්බන්ධව ලොග් සටහන් තබා ඇත. තෙවන පාර්ශව දේපළ/ පුද්ගල හානි සිදුවී නැත. සම්පූර්ණ අලාභය රක්ෂණ නියෝජිත ආයතනය ප්‍රතිපූර්ණය කිරීමට එකඟ වූ බැවින් පොලීසියට වාර්තා කර නැත. ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමි. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.755,972,796 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.451,560,612 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.304,412,184 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අයෝජන ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.978,316,002 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධ්‍යාපනය සැලසීම නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීම නිරත වන පාසල්, ආයතන, පදනම් සහ එවැනි ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම, වෘත්තීය නිපුණතා සහ දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට හැකි වන පරිදි වෘත්තීය අභ්‍යාස, ආයතන පිහිටුවීම සහ කළමනාකරණය කිරීම හෝ පිහිටුවීමට සහ කළමනාකරණය කිරීමට සහයවීම, අධ්‍යාපනය සැලසීමේ නිරතව සිටින කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ එවැනි වෙනත් තැනැත්තන්ගේ | ඉදිරියේ දී අරමුදලේ මූල්‍ය තත්වය ස්ථාවර වූ විට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරනු ඇත. | පනතේ සඳහන් මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිපුණතා සහ දක්ෂතා නංවාලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැලැසීම යන භාර අරමුදල් පනතේ 6.1 වගන්තියේ සඳහන් අනෙකුත් අරමුණු ඉටුකිරීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් අවධානය යොමුකර නොතිබුණි. | | |
| (ආ)භාර අරමුදල් පනතේ 6.2 (අ),(ඇ),(ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන ,තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබූ නමුත් එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගෙන නොතිබුණි. | කටයුතු කරමින් පවතී. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ)විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන දොරටු විවර කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ආයතනයක් භාර අරමුදලේ දායකත්වයෙන් පිහිටුවීමට 1998 ජුලි 08 දිනැති අංක 98/995/11/052 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය දී තිබුණි .ඒ අනුව අන්තර්කාලීන කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමක් පිහිටුවීමටත් අන්තර් කාලය අවසානයේ මොරටුව විශ්ව විද්‍යාල යටතට ගැනීමටත් අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ කටයුතු අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී තීරණය කර තිබුණි .ඒ අනුව 1982අංක 17දරන සමාගම් පනත යටතේ "ශ්‍රී ලංකා" යන නාමය ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම පිහිටුවා ඒ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරමින් සම්පත් දායකත්වය සැපයීමේ වගකීම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට පවරා තිබුණි .ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.<br>(i) 2003 මාර්තු 19 වන දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම සමඟ එළඹි ගිවිසුම අනුව භාර අරමුදලට අයත් මාලඹේ ප්‍රදේශයේ පිහිටි අක්කර 25ක භූමිය තුළ පිහිටවූ විශ්වවිද්‍යාලය අවුරුදු 8ක කාලසීමාවකට කළමනාකරණය කිරීම සඳහා එම සමාගමට දී තිබුණි .එම ගිවිසුම් කාල සීමාව ඉක්මවීමට පෙර එනම් 2005 නොවැම්බර් 14 දින නැවත භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම අතර ගිවිසුමකට එළඹ ඇති අතර එහි දී මුල් ගිවිසුමෙන් භාර අරමුදල සමඟ එකඟ වී තිබූ අරමුදලට වාසි සහගත වූ පහත සඳහන් කොන්දේසි ඉවත් කිරීම හා සංශෝධනය සිදුකර තිබුණි . | SLIIT ආයතනය සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ගවලට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට ඇත. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

ඉවත් කළ කොන්දේසි
-------------------------

- 4(ඉ) වගන්තිය -SLIIT ආයතනයේ වෙනත් ශාඛාවන් හෝ භාර අරමුදලෙහි අරමුණුවලට අනුකූල නොවන වෙනත් කිසිදු වාණිජ අරමුණක් වෙනුවෙන් මහපොළ විශ්ව විද්‍යාලයේ සියලුම වත්කම් හා ආදායම් සෘජුව හෝ වක්‍රව යොදා නොගත යුතු බව

- 4 (ඌ) වගන්තිය -විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු බව

- 4(එ) වගන්තිය -අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමෙන් ලබන ආදායම් එකතුකිරීම හා විශ්ව විද්‍යාලයේ ශුභ සිද්ධිය උදෙසා අවශ්‍ය වියදම් දැරීම SLIIT ආයතනයේ වගකීමක් බව

- 4(ක) වගන්තිය -විශ්ව විද්‍යාලය පිහිටුවීමේ අරමුණ සඳහා භාර අරමුදල විසින් ජාතික සංවර්ධන බැංකුවෙන් (NDB) සැලකිය යුතු ණය මුදලක් ලබාගෙන ඇති බවට SLIIT ආයතනය අවබෝධ කරගත යුතු බවත් ආයතනය මූල්‍ය ශක්‍යතාවයෙන් හෙබි විට වාරික ගෙවීම සඳහා වූ සෑම ප්‍රයත්නයකටම SLIIT ආයතනය සහතික වන බව

- 4(ච) වගන්තිය -විශ්ව විද්‍යාලයේ කළමනාකරණය හා ගිණුම් පරීක්ෂාව හා අගය කිරීම සඳහා දක්ෂ කළමනාකරුවන් හා විගණකයන්ගෙන් සමන්විත ස්වාධීන පුද්ගල කණ්ඩායමක් පත්කිරීමේ අයිතිය හා අලුතෙන් හඳුන්වාදිය හැකි නව පාඨමාලා පිළිබඳ ඇගයීම සඳහා සුදුසුකම් ලත් උගතුන් හා දක්ෂ පුද්ගලයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීමේ අයිතිය භාර මණ්ඩලය සතු වන බව

- 4(ඩ) වගන්තිය -භාර මණ්ඩල තීරණයට අනුව මාලඹේ විශ්ව විද්‍යාලය මහපොළ කැම්පස් ලෙස නම් කිරීම ,නව ශ්‍රවණාගාරය ලලිත් ඇතුලත් මුදලි ශ්‍රවණාගාරය ලෙස නම් කිරීම හා මෙම නාම පුවරු පැහැදිලිව පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව

- 4(ප) වගන්තිය -කාලය ඉකුත්වීම හේතුවෙන් හෝ වෙනත් ආකාරයකින් මෙම ගිවිසුම අවසන් වන අවස්ථාවේදී ,භාර අරමුදල විසින් මූල්‍යයනය කරන ලද වත්කම් භාර අරමුදලෙහි දේපල ලෙස පැවතිය යුතු බව

සංශෝධනය කළ කොන්දේසි

-------------------------------

- 2003 මාර්තු 19 වන දිනැති නෛතික ගිවිසුමේ 4(ඖ) වගන්තිය අනුව පැවති ,එකඟ වූ කළමනාකරණ ගාස්තුව අඩු කිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වන ආදායම්හි අතිරික්තය ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට පෙර භාර අරමුදලට බැර කළ යුතු බව හා භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අනිකුත් ආයෝජනයන් නොකළ යුතු බව .එසේ වුවද විශ්ව විද්‍යාලයේ අනාගත සංවර්ධනය සඳහා සංචිත ගිණුමක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාර අරමුදලෙහි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය හැකි අතර එවැනි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල භාර අරමුදල විසින් මෙම සංචිත ගිණුමෙන් ලබාදිය හැකි බව වෙනුවට නව ගිවිසුම මඟින් භාර අරමුදලට අයත් භූමිය බදුකුලී පදනම මත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට බද්දට දීමට තීරණය කර තිබූ අතර ගිවිසුමේ 5 (අ)(i) වගන්තිය අනුව වාර්ෂික බදු කුලිය ලෙස රු.මිලියන 8ක් හෝ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20යන අගයන් දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු බවට එකඟතාවයට පත්ව තිබුණි.

- භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2003මාර්තු 19වන දින ඇති වූ ගිවිසුමේ 4(ඕ) වගන්තිය අනුව විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් වූ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමේ අයිතිය භාර මණ්ඩලයට නියම වූ අතර විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු විය.එසේ වුවද භාර අරමුදල හා SLIIT ආයතනය අතර 2005නොවැම්බර් 14 වන දින ඇතිවූ දෙවන ගිවිසුමේ 4 (ඉ)සහ 4(ඊ) වගන්තිවලට අනුව SLIIT ආයතනයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව තීරණය කරනු ලබන ආකාරයට මෙම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමටද, ඒ අනුව චක්‍රලේඛ පිළියෙල කිරීම, විභාග පැවැත්වීම සඳහා සූදානම් කිරීම, සිසුන් බඳවා ගැනීම, අධ්‍යයන කාර්යය මණ්ඩලය සේවයේ යෙදවීම,

කළමනාකරණය හා යටිතල පහසුකම් නඩත්තුව SLIIT ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි සිදුකිරීමට ද ප්‍රධාන ඉදිකිරීම්වලදී පමණක් භාර අරමුදලෙහි අනුමැතියට යටත්ව කටයුතු කළ යුතු බවට එකඟත්වයට පත්ව තිබුණි.

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමට සිදුකරන ලද වියදම් ලෙස රු 373,579,392.ක ආයෝජන වටිනාකමට සරිලන මුදලක් නැවත අරමුදල වෙත ලබාදීම හා එමගින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම , භාර අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත )සමාගම අතර SLIIT ආයතනය ඉදිකර ඇති ඉඩම වෙනුවෙන් ඇති කරගත් කල්බදු ගිවිසුම ලෙස ගිවිසුම් දෙකකට 2015මැයි 12දින එළඹ තිබුණි. උක්ත ගිවිසුම් දෙක මගින් 2003 මාර්තු 19 වන දින ඇති කර ගත් මුල් ගිවිසුම හා 2005 නොවැම්බර් 14 දින ඇති කර ගත් ගිවිසුමෙන් භාර අරමුදලට වාසිසහගත වූ කොන්දේසි තවදුරටත් ඉවත් කර පහත සඳහන් නව කොන්දේසි එක් කර තිබුණි.

- භාර අරමුදල විසින් සිදුකළ ආයෝජන වටිනාකම ලෙස රු 373,579,392.ක් හා මහපොළ නමින් ලබාදුන් ශිෂ්‍යත්ව වටිනාකම සහ අනෙකුත් අනුෂාංගික වියදම් ආවරණය කිරීම සඳහා භාර අරමුදලට රු 408,500,000.ක මුදලක් ලබා දෙන බවත් ඉන් පසු මහපොළ අරමුදල හා SLIIT ආයතනය අතර කිසිදු මූල්‍යමය බැඳියාවක් නොමැති බව හා SLIIT ආයතනය මහපොළ අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකරන බව

- SLIIT ආයතනය කිසිදු ගිණුම්කරණ ප්‍රමිතියකට , ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියකට හෝ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතියකට යටත් නොවන අතර මහපොළ අරමුදල වෙත ගිණුම් වාර්තා ලබා දීමට හෝ 2016/2015 වර්ෂයේ සිට ගිණුම් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් කර ඇති බව

- 2015 මැයි 15 සිට 2075 මැයි 14 වන තෙක් අවුරුදු 60 ක් SLIIT ආයතනය පිහිටා ඇති මාළඹේ ඉඩම අවුරුදු 5කට වරක් වාර්ෂික බදු කුලිය වැඩිවන පදනමින් බදු දීම හා ඒ අනුව 2020 මැයි 14 න් අවසන් වන අවුරුදු 5සඳහා වාර්ෂිකව රු .මිලියන 20බැගින් ද වන පරිදි 2070 මාර්තු 15සිට 2075 මාර්තු 14 න් අවසන් වර්ෂ 5 සඳහා වාර්ෂිකව රු .මිලියන 40 බැගින් වන පරිදි බදු කුලී ගෙවීමට බැඳී ඇති බව

- මහපොළ අරමුදලේ හිමිකාරිත්වය සතු SLIIT ආයතනය වෙත බදු දී ඇති මාළඹේ පිහිටා ඇති ඉඩම හෝ එහි කොටසක් උප බදු දීම ,උකසට තැබීම සඳහා මහපොළ අරමුදලේ කිසිදු ලිඛිත අවසරයක් අවශ්‍ය නොවන බව

- SLIIT ආයතනයට ඔවුන්ගේ වියදමින් අදාළ භූමි පරිශ්‍රය තුළ ගොඩනැගිලි ඉදිකිරීම , යන්ත්‍රෝපකරණ සවිකිරීම හෝ අදාළ භූමිය ප්‍රතිසංස්කරණ, වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට අවසර ලබා දී ඇති බව

(iii) 2005 නොවැම්බර් 14 දින ඇතිකර ගිවිසුම අනුව 2015මැයි 12වන විට හිඟ හිටි බදු කුළිය රු.98,642,356 ක් 2015 ව තිබියදීමැයි 12දින සමාගම සමඟ නව කල්බදු ගිවිසුමකට එළඹ තිබූ අතර ,මුල් ගිවිසුමට අනුව 2015 වර්ෂයේ දී භාර අරමුදලට ලබාගත හැකිව තිබූ රු 45,358,379 .ක බදු කුලිය රු 20,000,000 .දක්වා අඩු වී තිබුණි . අමාත්‍ය මණ්ඩල තීරණයකින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් භාර අරමුදලට අවාසි සහගත වූ මෙවැනි ගිවිසුම්වලට එළඹීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් සිදු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(iv) තවද 2017 මැයි 17 දිනැති අංක අමප 011/701/0956/17/දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතයනය රජයට අයත් නොවන ,ස්වාධීන තීරණ ගැනීමේ හැකියාව ඇති ආයතනයක් ලෙස පිළිගැනීමට සහ එම ආයතනය කිසිදු අමාත්‍යාංශයක විෂය පථය යටතට නොගැනෙන පරිදි අමාත්‍යවරුන්ගේ විෂයන් හා කාර්යයන් පැවරීමට අදාළ ගැසට් නිවේදනයෙන් මෙම ආයතනයේ නාමය ඉවත් කිරීමටත් අනුමැතිය ලබාදී තිබුණි.

(v) තව ද 2015 එළඹි ගිවිසුම නීතියානුකූල නොවන බවට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමේ හා ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම යටතේ විමර්ශන 2 ක් විභාග වෙමින් පැවැති අතර 2019 ජූලි 12 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීමේ දී SLIIT ආයතනය සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ මාසයක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ භාර අරමුදලේ සභාපති වෙත දන්වා තිබූ අතර 2019 අගෝස්තු 02 දින එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

| | | |
|---|---|---|
| (ඇ)2018 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/18/1873/824/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව භාර අරමුදල නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ එළඹි ආයෝජන කළමනාකරණ ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ අනුව 2019 පෙබරවාරි 28 දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් විසින් කළමනාකරණය කරන ලද ආයෝජන කළඹ ලංකා බැංකු ආයතනික ශාඛාවේ මහපොළ භාර අරමුදල සතු ප්‍රධාන ගිණුම වෙත මාරු කර තිබුණි. තවද එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඇවර කිරීම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම විකිණීම සිදුකල යුතු වුවත් එම කටයුතු මේ දක්වා සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් 2019.12.31 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් භාර අරමුදල විසින් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි. | 2020 සිට ඉදිරි වර්ෂ 3 ක් සඳහා මහපොළ අරමුදලේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව සැලැස්මක් සකස් කරමින් ඉදිරිපත් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)2019 මැයි 29 දින පැවති අයෝජන කමිටුවේ තීරණයක් පරිදි ආයෝජන කළමනාකරණය සඳහා පළපුරුදු පුද්ගලයෙකු භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ පත් කිරීමට නිර්දේශ කලද, 2020 ජූලි 13 දින වන විටත් එම තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයෙකු බඳවාගෙන ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි. | සුදුසුකම්ලත් පුද්ගලයෙකු බඳවාගෙන ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන බඳවා ගැනීම සිදුකළ යුතුය. |
| (ආ)2018 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්යමණ්ඩලය 31 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 13 ක් වූයෙන් තනතුරු 18 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්ද ද්විතීය මට්ටමේ තනතුරු 06 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද පුරප්පාඩුව පැවතිණි. එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකර නොතිබුණි. | ඉදිරියේදී නව බඳවා ගැනීම් සඳහා කටයුතු කරනු ලැබේ. | ආයතනයේ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 - 2017 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් ඉන් පසු කාල පරිච්ඡේද සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කෙරේ. | ඉලක්ක ප්‍රමාණාත්මකව හා මූල්‍යාමය වශයෙන් දක්වා සැලසුම් පිළියෙළ කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 අනුව සංයුක්ත සැලැස්ම පදනම් කර ගත් ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර නොතිබුණි. | ඉදිරි වර්ෂ සඳහා සකස් කරනු ලැබේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුයි. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය කළ යුතුය. |

## 4.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන කමිටු රැස්වීම් සඳහා රජයේ විගණක කැඳවා නොතිබුණි. | ඉදිරි රැස්වීම්වල දී ඒ සම්බන්ධව කටයුතු කරනු ලැබේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල නිරීක්ෂකයෙකු ලෙස රජයේ විගණක කැඳවිය යුතුය. |